**අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදල - 2014**

----------------------------------------------------------

අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, සමුච්චිත අරමුදල සඳහා වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2007 ජූලි 17 දිනැති අරමුදලේ භාර ඔප්පුවේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. එකී මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

## 2.1 මතය

-------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට අධිකරණ යටිතල පහසුකම් නඩත්තු භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන්

අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 විගණනය සඳහා සාක්ෂි නොවීම**

වැඩ බැලීමේ පදනම මත අරමුදලේ රාජකාරීන් හි යෙදී සිටි නිලධාරීන් දෙදෙනෙකුට රු.97,187 ක වැඩ බැලීමේ දීමනාවක් ගෙවා තිබූ නමුත් පත්වීමේ ලිපි හා ඔවුන්ට දෙනු ලැබූ රාජකාරි ලැයිස්තු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.2.2 නීති, රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති,රීති,රෙගුලාසි ආදියට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | භාර ඔප්පුවේ 18 වගන්තිය | භාරකරුවන්ගේ රැස්වීම් අවම වශයෙන් සෑම මාස දෙකකට වරක් හෝ පැවැත්විය යුතු නමුත් සමාලෝචිත වර්ෂය තුළ රැස්වීම් 04 ක් පමණක් පවත්වා තිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | |
| i | 3.2 ( ආ) ඡේදය | අරමුදලේ ඉතිරිය වහාම ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු නමුත්, එය එසේ සිදුකර නොතිබුණි. |
| ii | 4.1 (අ) සහ (ඇ) ඡේදය | අනුමත අයවැය ලේඛනයක් නොමැතිව සමාලෝචිත වර්ෂය තුළ රු.15,083,768 ක මුදලක් මූලධන වියදම් ලෙස දරා තිබුණි. |

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.7,869,167 ක ඌනතාවයක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂය සඳහා ඌනතාවය රු.25,904,494 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.18,035,327 ක වර්ධනයක් දැක්වුණි. රු.2,000,000 කින් රජයේ ප්‍රදාන වැඩිවීම හා රු.16,923,327 කින් යටිතල පහසුකම් නඩත්තු වියදම් අඩුවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 මූල්‍ය කාර්යසාධනය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන හා විගණනයට ලබාගත හැකිවූ අනෙකුත් තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ යටිතල පහසුකම් නඩත්තු වියදම රු.14,782,999 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂය සඳහා වියදම හා 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2014 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2014 | 2013 | |
| | රු. | රු. | රු. |
| කළුතර මහාධිකරණ කලාපය | 4,555,740 | 9,274,098 | 14,129,710 |
| හම්බන්තොට / මාතර මහාධිකරණ කලාපය | 29,987 | 4,755,435 | 8,139,431 |
| හලාවත / පුත්තලම මහාධිකරණ කලාපය | - | 1,252,309 | 3,876,077 |
| උසාවි වැඩි දියුණු කිරීම් භාර අරමුදල් කාර්යාලය | - | - | 209,081 |
| කොළඹ මහාධිකරණ කලාපය | - | 3,625,827 | 11,349,034 |
| කුරුණෑගල මහාධිකරණ කලාපය | - | 7,677,832 | 9,507,787 |
| කෑගල්ල මහාධිකරණ කලාපය | - | 1,522,900 | 3,915,392 |
| ගාල්ල මහාධිකරණ කලාපය | 3,339,504 | 1,050,000 | 4,453,201 |
| අවිස්සාවේල්ල මහාධිකරණ කලාපය | 968,000 | - | 1,340,598 |
| අනුරාධපුරය මහාධිකරණ කලාපය | 2,254,172 | - | 3,014,172 |
| යාපනය මහාධිකරණ කලාපය | - | 406,000 | 406,000 |
| ගම්පහ මහාධිකරණ කලාපය | - | 1,610,110 | 10,395,810 |
| මොණරාගල කලාපය | 1,593,900 | - | 1,593,900 |
| පොළොන්නරුව කලාපය | 1,558,649 | - | 1,558,649 |
| අධිකරණ සේවා කොමිෂන් සභා ජාල ව්‍යාපෘතිය | 483,047 | 531,816 | 1,014,863 |
| එකතුව | 14,782,999 | 31,706,327 | 74,903,705 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපකරණ මිලදී ගැනීම සඳහා මහාධිකරණ කලාපවලට අරමුදල් මුදා හැරීම හා අධිකරණ වල නඩත්තු පිරිවැය දැරීම අරමුදලේ එකම කාර්යය විය. ඒ අනුව 2009 සිට 2014 දක්වා කාල පරිච්ඡේදය තුළ රු.74,903,705 ක මුදලක් අධිකරණ කලාපවලට මුදා හැර තිබුණි. අධිකරණ කලාප විසින් අදාළ ප්‍රසම්පාදන කාර්යයන් සිදුකර තිබුණද, ඒ සඳහා රු.1,290,329 ක පොදු කාර්ය වියදමක් අරමුදල විසින් මෙම කාල පරිච්ඡේදය තුළ දරා තිබුණි.

(ආ) මේ අතර එම කාර්යයන් සඳහාම අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ යටිතල පහසුකම් අංශය විසින් ඔවුන්ගේ ප්‍රධාන කාර්යය ලෙස වර්ෂයකට රු. මිලියන 800 ක මුදලක් වැය කර තිබුණි. එබැවින් අරමුදලේ වෙනම කාර්යයක් ලෙස එකම කාර්යයන් සඳහා අරමුදල් යොදා ගැනීම විගණනයේදී ප්‍රශ්නගත වේ.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම

අරමුදලේ අරමුණු හා පරමාර්ථ ඉටු කර ගැනීමට අරමුදල සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර 2009 සිට 2014 දක්වා වර්ෂයන් තුළ ක්‍රියාත්මක කළ යුතුව තිබූ කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක්ද පිළියෙල කර නොතිබුණි.

### 5.2 අයවැය පාලනය

2009 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

---------------------------

අරමුදලේ කාර්යයන් පිළිබඳ අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**5.4 විගණන හා කළමනාකරණ කමිටුව**

-----------------------------------------

අරමුදල ආරම්භයේ සිටම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි. තවද සාකච්ඡා කිරීම සඳහා විකල්ප ක්‍රියාමාර්ග ද පිළියෙල කර නොතිබුණි.

**6. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) අභ්‍යන්තර විගණනය

(ආ) අයවැය